## 1.1 හැඳින්වීම

ලාංකේය සමාජය ඇසුරෙහි භාවිත කලාවන් අතුරින් අද්‍යතනයේ නර්තනය ජනප්‍රිය භාවිතාවක් බවට පත්ව ඇත. නර්තනය වූ කලී ලාංකේය සමාජයේ පමණක් නොව ලොව සියලු ලොව සියලුම සමාජයක ප්‍රාථමික ජනසමාජවල සිට පැවත එන කලාවන්ගෙන් මූලික වූවකි. එය ජීවී ලෝකයේ ආරම්භයේ සිට අනන්තය දක්වා විහිදී යන්නකි. ජීව විද්‍යාත්මක මිනිස් සත්ත්වයාගේ ඇතිවන චිත්තවේග ප්‍රකාශ කිරීම සඳහා උපයෝගී කරගත්තා වූ අවිධිමත් චලන විධිමත් ලෙස සංවිධානය වීම තුළින් නර්තනය බිහි විය. එතැන් පටන් මිනිසුන් විසින් ගොඩනගා ගන්නා ලද සමාජ අවස්ථාවලට අනුව නොයෙක් හැලහැප්පීම් සහ ඥාණ අවශ්‍යතා ඔස්සේ අනේක තරම් විවිධ ප්‍රවණතා ඇති වෙමින් වර්තමානය දක්වා ක්‍රමිකව වර්ධනය වී ඇත.

අද්‍යතන ලාංකේය නර්තනයේ ප්‍රමුඛ ප්‍රකාශන මාදිලියක් ලෙස මුද්‍රා නාට්‍ය හැඳින්විය හැකිය. **"නර්තනය හා නාට්‍යයේ ඒකාබද්ධතාවයෙන් නර්තන චලන ප්‍රධාන ප්‍රකාශන මාධ්‍යය වශයෙන් ගෙන නාට්‍යයක් රඟ දැක්වේ ද එය මුද්‍රා නාට්‍යයකි."**[01] මෙහිදී මුද්‍රා නාට්‍ය ශිල්පියාගේ ප්‍රවේශය විවිධාකාර විය හැකිය. කෙසේවතුදු තේමාව, චලන රටා, සංගීතය, අංග රචනය, රංග වස්ත්‍රාභරණ, රංග භාණ්ඩ, වේදිකා පසුතල ආදිය එකතුවෙන් නිර්මිත කාලීය වේදිකාවේ සමස්ත සම්පත් කැටිකොටගත් පූර්ණ වේදිකාරංගයක් වීම අත්‍යවශ්‍යය. පූර්වෝක්ත කලා අංගයේ ප්‍රධාන ප්‍රකාශන මාධ්‍යය වන්නේ චලනයයි. භාව ප්‍රකාශනයයි. ඉහත සඳහන් කලා අංග මුද්‍රා නාට්‍යයේ අන්තර්ගත වුවද එය නිර්වාචිකය. මෙම මාධ්‍යයේ අභිනයේ ශබ්ද ධ්වනිය ද, ධ්වනි දෝංකාරය ද යථෝක්ත නිර්වාචකත්වය විවරණය කරයි. මුද්‍රා නාට්‍ය තුළ අදහස් ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාවය උදෙසා භාෂාව උපයෝගී නොවන හෙයින් **"නර්තකයා තම හැඟීම් භාව ප්‍රකාශනය හා මුහුණ කොට සමස්ත සිරුරෙන්ම (අංග, ප්‍රත්‍යංග, උපාංග මගින්) අදහස් දැක්වීම සිදුකරනු ලැබේ."**[02] මෙම සන්නිවේදන ක්‍රියාවලිය වඩාත් සිදු කිරීම උදෙසා දායක වනුයේ ආනුෂංගික අංගයෝය.

ඒ අතුරින් බහුල ලෙස සංවාදාත්මක ප්‍රවාහයකට ලක් නොවන නමුත් සුවිශේෂී මෙහෙයක් සිදුකරන කලා අංගයක් ලෙසින් අංග රචනය හැඳින්විය හැකිය. මෙය සමස්ත කලා මාධ්‍ය අතර දෘශ්‍යමය පාර්ශවයක් ලෙස ප්‍රේක්ෂකයා වෙතට විවර වූ අංග ස්වභාවධර්මය ඇසුරෙහි හැදි

---

01. සුනිල් විජේසිරිවර්ධන සමඟ 2010.11.08 වන දින පොල්ගස්ඕවිට (ජාතිකත් සාහිත්‍ය) එම නිවසේ දී පැවැත් වූ සම්මුඛ සාකච්ඡාව ඇසුරින්
02. සංස්, දේශීය මුද්‍රා නාට්‍ය කෙරෙහි ගත අවලෝකනයයි. පතිරණ ; ගේ ... (සංස්), දිසානායක මුද්‍රිතගේ ... සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 2002, ජනවාරි ප්‍රති කලාපය, 10 පිටුව

වල්ලුණු මිනිසා වර්ගයාගේ ප්‍රාතිහාර්යය සොයාගැනීමත් සමග බිහි වූ කලාත්මක පාර්ශවයකි. මුල් යුගයේ එය යොදාගත්තේ මිනිස් සන්තානයෙහි පහළ වූ ස්වභාවික සහ මනෝමය චිත්ත රූප සිදුවීම් පළිදැක්වීම උදෙසාය. එනම් ගෝත්‍රික යුගයේ මිනිසා සතුන් දඩයම් කිරීමේ උපක්‍රම ලෙසින් මුහුණු පාට කිරීමේ ක්‍රමය යොදාගන්නට ඇත. පසුකාලීනව අංග රචනා කලාවක් බිහිවීම උදෙසා එය මූලික පදනම විය. මෙහිදී වර්ණ රේඛා හැඩතල නම් වූ මාධ්‍යයන් උපයෝගී කොටගනිමින් විචිත්‍රවත් ලෙස නැවීම සිදුකරයි. අංග රචනය සතු ප්‍රමාණාත්මක හා ගුණාත්මක ගතතාවයක් , නිර්මාණාත්මකභාවයක් කිසි පරිදි ප්‍රයෝජනයට ගනී නම් එමගින් මිනිස් සිතේ රස උපදවීම සඳහා භාව ප්‍රකාශනය වඩාත් අර්ථසම්පන්න ලෙස සිදුකරගත හැකිය. එයින් මිනිස් සිතෙහි හැඟීම් තීව්‍ර වේ. එම හැඟීම් තීව්‍ර වූ කළ ඇතිවනුයේ රසයකි. සෑම මාධ්‍යයකින් වුවද බලාපොරොත්තු වන මූලාර්ථය වනුයේ රස ඉපැද්දවීමයි.

මෙම නිබන්ධයෙන් ප්‍රධාන වශයෙන් අධ්‍යයනය කෙරෙනුයේ මුද්‍රා නාට්‍යයේ භාව ප්‍රකාශන තීව්‍රතාව සඳහා අංගරචනය නම් වූ ප්‍රවීණයේ කලා අංගය කෙසේ භාවිත වේදැයි යන්නය. අංගරචනය වූ කලී ප්‍රායෝගික ක්‍රියාවලියක් වන බැවින් එය ශිල්පීය ප්‍රාගුණ්‍යය හා දැනුම අනුව මෙන්ම ආත්මීය ලක්ෂණ මත වෙනස්කම්වලට භාජනය වන්නකි. නමුදු නිර්මාණයේ ස්වභාවය මත යම් මූලධර්ම පද්ධතියක් තුළ පවතින ක්‍රමවේදයක් පවතී. භාව ප්‍රකාශණය කරනා මෙය විපර්යාසයන්ට ලක්වුවද එය නිර්මාණකරණය කරනා ඉදිරියට යා යුතුය. මේ පිළිබඳව විවිධ අදහස් මතිමතාන්තර සාකච්ඡා පවතින සමාජ පසුබිමක් තුළ මුද්‍රා නාට්‍ය ප්‍රේක්ෂකයා හා විද්වත් අර්බුදයට ගැඹුරු සාධාරණීය විසඳුම් ලබාදීමටත් ඒ සඳහා අර්ථාන්විත යෝජනා ඉදිරිපත් කිරීම ද මෙහිදී සිදු කෙරේ.

එමෙන්ම මෙම පර්යේෂණ නිබන්ධනය මගින් සමාජ මනෝභාවයන් ගැඹුරු වින්දන කලයකට ගෙන යන මුද්‍රා නාට්‍ය වැනි සජීවී මාධ්‍යයන් උදෙසා ප්‍රේක්ෂක අවධානය පිලිබිඹු මිය සම්ප්‍රදාය ප්‍රේක්ෂක භූමිකාව සක්‍රිය කරවීමට මහෙපොත්ව්මත් සිදු කළ හැක. මුද්‍රානාට්‍ය නම් වූ ප්‍රවීණයේ කලා ක්ෂේත්‍රයට අදාල විවිධ අදහස් මතිමතාන්තර නොයෙක් පොතපත වල වුවද නොයෙකුත් කලා අංගයන්ගේ අංග රචනා සම්බන්ධ පොත පත වල වුවද අදාලත මුද්‍රා නාට්‍යයේ භාව ප්‍රකාශන තීව්‍රතාව සඳහා අංග රචනා භාවිතය පිළිබඳ පොත පත, ශාස්ත්‍රීය ලිපි වල වී නොමැත. මෙම ශිල්පීය දැනුම අන්තර්ගත ප්‍රායෝගික භාවයන් අඩංගු පර්යේෂණ නිබන්ධන ලිපි අල්පය. අංග රචනය පිළිබඳ සිද්ධාන්තමය හා ප්‍රායෝගික කරුණු ඇතුළත් ලිඛිත මූලාශ්‍ර අවම බවත් අපට හැගේ. ඒ පිළිබඳව ප්‍රේක්ෂක ඥාන පරාසයේ ගුණාත්මක බව හර කරනු වස් මෙම පර්යේෂණ නිබන්ධනය කාලීන අවශ්‍යතාවක් පූර්ණය කරනු ඇත.